සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම/විභාග අංකය :- .......................................................... කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලියා වී ඇති කෘතිය වන්නේ,
(1) දීප වංශය (2) මහාවංසය (3) පූජාවලිය (4) රාජාවලිය

(02) ග්‍රීක මූලාශ්‍රයක් වන ''ඩිමුන්ඩෝ'' නමැති කෘතිය රචනා කළ ලේඛකයා වූයේ,
(1) ඇරිස්ටෝටල් ය. (2) ඔනෙසික්‍රිටස් ය. (3) මෙගස්තිනිස් ය. (4) සීසර් ය.

(03) සෘෂිගිරි ඇමතිවරයා කරවූ වල්ලිපුරම් රන්පත් ලේඛනය වැදගත් මූලාශ්‍රයකි. මෙකල රාජ්‍යත්වය දරනු ලැබුවේ,
(1) මහසෙන් රජු (2) ධාතුසේන රජු (3) දෙවන අග්බෝ රජු (4) වසභ රජු

(04) අස්ව හිස සහ මිනිසා දක්වෙන මූර්තිය දැකගත හැකි ස්ථානය වන්නේ,
(1) ඉසුරුමුණි විහාරය (2) රුවන්වැලිසෑය (3) අභයගිරිය (4) ජේතවනාරාමය

(05) පහත සඳහන් විදේශිකයින් අතුරෙන් ශ්‍රී ලංකාවට නොපැමිණ එහෙත් ලංකාව පිළිබඳ තොරතුරු අසා වාර්තා සැකසූවන් දක්වෙන පිළිතුර කුමක් ද?

A - ප්ලිනි B - පාහියන් හිමි C - රොබට් නොක්ස්
D - හියුංසියැං E - ඉබන් බතුතා F - මෙගස්තිනීස්

(1) B C E (2) A E F (3) A D F (4) C D F

(06) මෙරටින් හමුවන පැරණිතම කාසි වර්ගය වූයේ,
(1) තඹමස්ස (2) කහාපණ (3) ධරණ (4) ස්වස්තික

(07) අර්ධ ශුෂ්ක කලාපයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් නොවන්නේ,
(1) බූන්දල (2) මිනිහාගල්කන්ද (3) මාතොට (4) රාවණාඇල්ල

(08) පහත දක්වෙන X හා Y තීරු නිවැරදිව ගැලපූ විට අදාල පිළිතුර තෝරන්න.,

| X | Y |
|---|---|
| 1. ගෝපාලගාම | A - ධීවරයින් විසූ ගම් |
| 2. මණිකාරගාම | B - වඩුවන් විසූ ගම් |
| 3. කසීකාරගාම | C - ගොපල්ලන් විසූ ගම් |
| 4. කේවට්ටගාම | D - ගොවියන් විසූ ගම් |
| | E - මැණික් කර්මාන්තයේ යෙදුනු අය විසූ ගම් |

(1) CBDA (2) CEDA (3) DEAB (4) CEBA

(09) ශ්‍රී ලංකාවේ ගල්යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශය වන්නේ,

(1) පහතරට වියළි කලාපය (2) කඳුකර පහත්බිම් සහිත ප්‍රදේශය

(3) අර්ධ ශුෂ්ක කලාපයේ මැටි හා බොරළු තට්ටුව (4) තෙත් කලාපය

(10) සෙල්ලිපි වල හා වංශකථා වල ' පට්ඨානගාම' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(1) වරාය ආශ්‍රිත ගම් (2) වෙළඳ ගම්

(3) ජනතාව අතහැර දමූ ගම් (4) වාපි ගම්

(11) වියළි කලාපයේ කෘෂිකර්මාන්තයට වඩාත් උචිත පස වූයේ,

(1) රතු පස (2) රතු දුඹුරු පස

(3) මැටි පස (4) බොරළු පස

(12) කිරිඳි ඔය හරස්කර අමුණක් බැන්ද වූ රජතුමා වූයේ,

(1) කේෂධාතු කාශ්‍යප (2) මහානාග

(3) ඉලනාග (4) කාවන්තිස්ස

(13) මෙරට දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ නිළධාරීන් X තීරුවේ ද අතීතයේ ඔවුන් හැඳින් වූ නම් Y තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 1. භාණ්ඩාගාරික | A - නගරගුතික |
| 2. ඇත් අංශයේ ප්‍රධානි | B - බඩගරික |
| 3. නගර පරිපාලක | C - බතගු |
| 4. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි | D - කනපෙඩික |
| | E - හකි අදෙක |

(1) CBAD (2) BEAD (3) BEDA (4) CEAD

(14) ඉන්දියාවේ අශෝක රජතුමා විසින් එවන ලද පංච කකුධ භාණ්ඩ භාවිත කොට අභියෝග උත්සවයක් පැවැත් වූ රජතුමා වූයේ,

(1) දෙවන පැතිස් (2) දුටුගැමුණු (3) මහසෙන් (4) වසභ

(15) වියළි කලාපයේ වැසියන් වැව් පද්ධතියක් හැඳින්වූයේ,

(1) වැව් ප්‍රපතනය (2) වැව් ජාලය (3) වැව් පොකුර (4) එල්ලංගාව

(16) පොළොන්නරුව ආරම්භ රාජ්‍ය පාලකයා වූ මහා විජයබාහු රජතුමා විවාහ සබඳතා මගින් සුහදත්වය ගොඩනැගූ රාජ්‍ය යුගලය වන්නේ,

(1) කාලිංග හා කේරළ (2) කාලිංග හා චෝල

(3) පාණ්ඩ්‍ය හා චෝල (4) කාලිංග හා පාණ්ඩ්‍ය

(17) අතීතයේ මෙරට පැවති කර්මාන්ත X තීරුවේ ද ඒ හා සම්බන්ධ සෙල්ලිපි මූලාශ්‍ර Y තීරුවේ ද වේ. ඒවා නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 1. යකඩ කර්මාන්තය | A - වෙහෙරකෙම සෙල්ලිපිය |
| 2. පේෂ කර්මාන්තය | B - මුතුගල්ල සෙල්ලිපිය |
| 3. රන් කර්මාන්තය | C - වේගිරිය සෙල්ලිපිය |
| 4. ඇත්දත් කැටයම් කර්මාන්තය | D - මණ්ගල සෙල්ලිපිය |

(1) CBDA (2) BCDA (3) BADC (4) BDAC

(18) වේලෛයික්කාර හමුදාවේ සහාය පැතූ පැරණිතම රජවරුන් දෙදෙනා වූයේ,
(1) ඉලනාග හා උත්තිය (2) ඉලනාග හා අභයනාග
(3) අභයනාග හා වසභ (4) උත්තිය හා අභයනාග

(19) පහත සඳහන් කරුණු අතරින් පොළොන්නරු රාජධානි සමයේ මෙරටට පැමිණි අයෙකුට දකින්නට හෝ අසන්නට නොලැබෙන සිදුවීම් යුගලය වන්නේ,

A - රුවන්වැලිසෑය
B - පරාක්‍රම සමුද්‍රය
C - කෝට්ටේ බලකොටුව
D - කලා වැව
E - චන්ද්‍රභානුගේ ආක්‍රමණය
F - මහා විහාරය

(1) B හා D (2) E හා F (3) C හා E (4) D හා E

(20) අතීතයේ මැටිබඳුන් වර්ණ ගැන්වීම සඳහා යොදාගෙන ඇත්තේ,
(1) ගුරුගල්. (2) කහදගල් (3) තිරුවානා ගල් (4) කලුගල්

(21) පුරාණ අවධියේ මෙරට විසූවන් දුර හා කාලය මැනීමට යොදාගත් මිනුම් යුගලය වන්නේ,
(1) කුරුණි හා තිරීය (2) යොදුන හා හවජර
(3) යොදුන හා ගුන්ජා (4) කරීස හා ගව්ව

(22) සංඝමිත්තා මෙහෙණින් වහන්සේ විසින් ශ්‍රී මහා බෝධිය රැගෙන මෙරටට පැමිණි නැව්තොට වන්නේ,
(1) ලංකාපටුන (2) ගෝකණ්ණතිත්ථ (3) මහාතිත්ථ (4) දඹකොළපටුන

(23) පහත දැක්වෙන X හා Y තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 1. ධාතුසේන රජු | A - තිසා වැව |
| 2. පණ්ඩුකාභය රජු | B - මින්නේරිය වැව |
| 3. මහසෙන් රජු | C - බසවක්කුලම වැව |
| 4. දෙවනපෑතිස් රජු | D - කන්තලේ වැව |
| | E - කලා වැව |

(1) ECBA (2) EBCA (3) EDBA (4) BCDA

(24) නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේදයක් අනුව සකස් කර ඇති පැරණි අත්තිවාරමකට උදාහරණයක් වන්නේ,
(1) ථූපාරාම දාගැබ (2) ආලාහන පිරිවෙන (3) රුවන්වැලිසෑ දාගැබ (4) ලෝවාමහාපාය

(25) විසි වතාවක් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් යැවූ රජතුමා වන්නේ,
(1) I ගජබාහු (2) භාතිකාභය (3) අග්ගබෝධි (4) නිශ්ශංකමල්ල

(26) ක්‍රි.ව 850 දී ශ්‍රී පාදය වන්දනා කිරීමට පැමිණි දේශ ගවේෂකයා වන්නේ,
(1) සුලෙයිමාන් ය (2) ඉබන්බතුතා ය (3) අල්බලසූරිය ය (4) ඉබන් ශහ්රියර් ය

(27) නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කර ඇති මූලාශ්‍රය වන්නේ,
(1) වෙස්සගිරිය (2) කොන්ඩවට්ටවාන් (3) බුද්ධන්නෙහෙල (4) වේවැල්කැටිය

(28) ඓතිහාසික සමාජයේ ප්‍රභූන් ලෙස හඳුන්වා නොදුන් වෘත්තියක් වූයේ,
(1) ගුරුවරු (2) ගොවියන් (3) වෛද්‍යවරු (4) වෙළඳ ප්‍රධානීන්

(29) කිසිදු සතෙකු නොමැරිය යුතු බව ' මාඝාත නීතිය' මගින් දැනුම් දුන් රාජ්‍ය පාලකයා වන්නේ,

(1) කුටකණ්ණඅභය රජු (2) හතරවන මහින්ද රජු

(3) දෙවන උදය රජු (4) අමණ්ඩගාමිණී අභය රජු

(30) පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කරන ලද්දේ මින් කවර රාජධානි සමයකදී ද?

(1) යාපහුව (2) කෝට්ටේ (3) ගම්පොල (4) කුරුණෑගල

(31) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු පිහිටුවා ගත් දුර්ග ආශ්‍රිත බලකොටු හා ඒවායේ ප්‍රධානීන් සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 1. යාපහුව | A සංඛ සෙනවි |
| 2. ගොවින්දමලය | B තුන්වන විජයබාහු රජු |
| 3. ගංදෙනිය | C සුභ සෙනෙවි |
| 4. දඹදෙණිය | D බුවනෙකබාහු ආදිපාදවරයා |

(1) CADB (2) BCDA (3) CDAB (4) DCBA

(32) යාපහුවේ පළමුවන බුවනෙකබාහු රජු සබඳතා පැවැත් වූ විදේශ රට වූයේ,

(1) ඉතාලිය (2) ඊජිප්තුව (3) ඉන්දියාව (4) ප්‍රංශය

(33) පොළොන්නරුවේ තෙවරක් රාජ්‍යත්වයට පත් වූ රැජිණ වන්නේ,

(1) ලීලාවතී බිසව (2) සුගලා බිසව (3) අනුලා බිසව (4) චූලසීවලී රැජිණ

(34) නිශ්ශංක අලකේෂ්වර ඇමතිවරයා විසින් ශක්තිමත් බලකොටුවක් ඉදිකරවූ ප්‍රදේශය වූයේ,

(1) ගම්පොල (2) මහනුවර (3) දඹදෙනිය (4) කෝට්ටේ

(35) පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට කෝට්ටේ පාලකයා වූයේ,

(1) හයවන බුවනෙකබාහු රජු (2) අටවන වීර පරාක්‍රමබාහු රජු

(3) හයවන පරාක්‍රමබාහු රජු (4) ජයබාහු රජු

(36) මහනුවර රාජධානි සමයේ ඇතුන්ගේ කටයුතු බාරව සිටින ලද්දේ,

(1) අස් පන්තියේ මුහන්දිරම් (2) ගජනායක නිලමේ

(3) මහා ගබඩා නිලමේ (4) බත් වඩන නිලමේ.

(37) ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට පත් වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පිටුවහල් කල ප්‍රදේශය වූයේ,

(1) දිල්ලිය (2) මද්‍රාසිය (3) වෙල්ලෝරය (4) බෙංගාලය

(38) මහනුවරට වැඩමවීමට පෙර දන්ත ධාතුන් වහන්සේ වැඩ සිටින ලද්දේ,

(1) දෙල්ගමුව (2) බෙලිගල (3) කොත්මලේ (4) පුලතිසිපුර

(39) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය ආරම්භ කල මුල් ම යුරෝපා ජාතිය වූයේ,

(1) ප්‍රංශ (2) පෘතුගීසි (3) ලන්දේසි (4) ඉංග්‍රීසි

(40) මහනුවර රාජධානි සමයේ බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකර වීමට නායකත්වය දුන් සංඝරාජ හිමියන් වූයේ,

(1) හික්කඩුවේ සුමංගල හිමි (2) වාරියපොල සුමංගල හිමි

(3) වලානේ සිද්ධාර්ථ හිමි (4) වැලිවිට සරණංකර හිමි

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - II

**නම/විභාග අංකය :- ........................................................** **කාලය: පැය 03 යි.**

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ත්‍රිකුණාමලය, මහවැලි ගඟ, බුන්දල, මහනුවර, කලාවැව, ඌරාතොට, වලවේ ගඟ, පාහියන්ගල, මහාවාලුකාගාම, මඩකලපුව, මින්නේරිය වැව, රංචාමඩම (ලකුණු 12)


(ii) සුමාත්‍රා, සුභපැතීමේ තුඩුව, ගෝව, බ්‍රිතාන්‍ය, රතු මුහුද, ඇෆ්ගනිස්ථානය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින්, නම් කරන්න.

A - 'නරේශ්වර' නමින් තමන් හඳුන්වාගත් රජතුමා.
B - උඩරට අවසාන සිංහල රජතුමා.
C - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය කෘතියේ කතුවරයා
D - මහාවංශයේ මුල් කොටස රචනාකල භික්ෂූන් වහන්සේ (ලකුණු 04)

A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) (1) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(2) මෙම මුලාශ්‍රය දැකගත හැකි ප්‍රදේශය කුමක් ද?
(3) මෙය කරවූ රජතුමා කවුරුන් ද?
(4) මෙහි ඇති විශේෂ ස්වභාවය කුමක් ද?
(ලකුණු 04)


A රූපය

(iii) (1) මෙම B රූපයේ සිටින රාජ්‍ය පාලකයා කවුරුන් ද?
(2) මෙතුමා සිටි රාජධානිය කුමක් ද?
(3) මෙතුමා රජ වීමට පෙර හැඳින්වූයේ කවර නමකින් ද?
(4) මෙතුමාගේ පාලන සමයේ මෙරටින් පලවාහැරි බටහිර ජාතිය කවුරුන් ද? (ලකුණු 04)


B රූපය

## II කොටස

(02) (i) මෙරටින් අතීතයේදී හමු වී ඇති විදේශීය කාසි අයත් රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා ලියන්න.
(ගිරිලිපි, දීපවංශය, කෛලාය මාලෛ,පදිර්රුපත්තු, ටොලමි, ප්ලීනි, ටැම්ලිපි, මහාවංශය)

A- ලංකාව ගැන තොරතුරු සඳහන්ව ඇති දකුණු ඉන්දීය ග්‍රන්ථය.

B- නැචුරාලිස් හිස්ටෝරියා ග්‍රන්ථයේ කතුවරයා.

C- මෙරට පැරණිතම කෘතිය

D- සකස් කර ගත් ගල් කුලුණු මත ලියූ ලිපි (ලකුණු 04)

(iii) ගල් යුගයට අයත් අභිචාර විධි හඳුනාගෙන ඇති ස්ථාන තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව පිළිබඳව කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) ශිලා මංජුසා සොහොන් පැවති බවට සාක්ෂි ලැබී ඇති ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) මුල් ඓතිහාසික යුගයට අයත් වාපිගාම හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දැකිය හැකි වූ පරිවර්තනීය ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දුටුගැමුණු රජතුමා මෙරට සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකි. එතුමාගේ සේවාවන් දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පහතින් සඳහන් කර ඇති A, B, C, හා D වලින් දැක්වෙන කරුණ හා සම්බන්ධ කෙටි යෙදුම් වරහන තුළින් තෝරා ලියන්න.
(කබර, වොහාර, පිටිබිම්, නවඳලිහේන, වෙජ, මාණිකර, තුලාධර, නීතිවේදී)

A- ක්‍රි.පූ. දෙවන සියවසේ වෛද්‍යවරුන් මෙලෙස හඳුන්වා ඇත.

B- පැරණි ලේඛනවල රන් කරුවන් හැඳින්වීමට යොදා ඇත.

C- අලුතින් ගිනිතබාගත් හේන

D- නීතිය පිළිබඳ හසල දැනුමක් ඇත්තා (ලකුණු 04)

(iii) බදුලු ටැම්ලිපියේ සඳහන් වෙළඳ නීති තුනක් සඳහන්කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ මෙරට දියුණු කර්මාන්ත පැවති බව කරුණු තුනකින් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) අතීතයේ බදු නීතිය යටතේ අයකල ප්‍රධාන බදු වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) A, B, C හා D කරුණුවට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.
(ගොඩවාය, මහමත, දූදිගම ඇත් පහන, සිතුල් පව්ව, අඩික, පීඩන ශල්කනය, බීම් වීදුරු)

A - අතීතයේ ඇළ මාර්ග ඉදිකිරීමට පත්කල නිලධාරියා

B - වෙර යොදා බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා ගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය

C - වරායකින් අයකල රේගු බදු විහාරයකට පූජා කල බව දැක්වෙන සෙල්ලිපිය

D - ස්ථිතික ජල විද්‍යා මූලධර්මය භාවිත කර කල නිර්මාණය (ලකුණු 04)

(iii) (a) වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න.

(b) වැවක අංගයක ප්‍රයෝජනය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලාංකික සමාජය තුල කාන්තාවට ගෞරවනීය ස්ථානයක් පැවති බව කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) පළමු නාගරීකරණයට අයත් වූ පැරණි නගර තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A, B, C හා D ට අදාල පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.
(පරරාජසේකරම්, වෙන් හෝ, යුංලෝ, දෙවන පරාක්‍රමබාහු, ඉබන්බතුතා, සුලෙයිමාන්, හතරවන පරාක්‍රමබාහු, විජය කුලංකෙ)

A- ගම්පොල රාජ්‍ය සමයේ මෙරටට පැමිණි අරාබි දේශසංචාරකයා.

B- කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත උපාධියෙන් පිදුම් ලැබූ රජතුමා.

C- ගම්පොල රාජ්‍ය සමයේ පැමිණි චීන සෙන්පති.

D- යාපන රාජධානියේ ආරම්භක රජතුමා. (ලකුණු 04)

(iii) කෝට්ටේ ප්‍රථම පාලකයා වූ හයවන පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු තුනක් හඳුන්වා ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) උඩරට සමාජයේ පැවති විවාහ ක්‍රම තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) උඩරට රජතුමා විසින් ම විසඳන ලද නඩු වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ සේවාවන් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) උඩරට රාජ්‍යයේ පැවැති ආර්ථික ක්‍රමය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ආරම්භ කල වතු බෝග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සොයා ගැනීම් සිදුකල පුද්ගලයින් පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04)

C- මුද්‍රණ යන්ත්‍රය නිපදවීම.

B- දුරදක්නය නිපදවීම.

C- පිලිපීනය සොයා ගැනීම.

D- ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

(iii) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපීයයන් නව මුහුදු සොයා යාම සාර්ථක කර ගැනීමට ඉවහල් වූ කරුණු දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න (ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ කතෝලික සභාවේ දුර්වලතා විවේචනය කල තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් ක්ෂේත්‍රයන්ට සම්බන්ධ අය වරහන තුලින් තෝරා ලියන්න.
(ජොහැන්නස් ක්‍රේප්ලර්, මයිකල් සර්ටෙස්, විලියම් හාවේ, වස්කෝදගාමා, බර්තොලමියු ඩයස්, නිකලස් කොපර්නිකස්, මැසෙක්ෂියෝ)

A - අප්‍රිකාවේ කුණාටු තුඩුවට පැමිණි දේශගවේෂකයා.

B - පෘතුවිය ගෝලාකාර බව

C - ග්‍රහලෝක සූර්යා වටා ඉලිප්සාකාරව ගමන් කිරීම.


D - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු. (ලකුණු 04)

(iii) A- පුනරුද සමයේ සිටි චිත්‍ර ශිල්පීන් තිදෙනෙකු ද

B- පුනරුද සමයේ නිර්මාණය වූ ලෝ ප්‍රකට චිත්‍ර නිර්මාණ දෙකක් ද නම් කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපයේ ඇතිවූ පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය (a) දේශපාලන (b) ආර්ථික ක්ෂේත්‍ර ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(01) (අ) (i)



(01) (අ) (ii)



සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 2 | (21) | 2 | (31) | 3 |
| (02) | 1 | (12) | 3 | (22) | 4 | (32) | 2 |
| (03) | 4 | (13) | 2 | (23) | 1 | (33) | 1 |
| (04) | 1 | (14) | 1 | (24) | 3 | (34) | 4 |
| (05) | 3 | (15) | 4 | (25) | 3 | (35) | 2 |
| (06) | 2 | (16) | 4 | (26) | 1 | (36) | 2 |
| (07) | 4 | (17) | 3 | (27) | 2 | (37) | 3 |
| (08) | 2 | (18) | 2 | (28) | 2 | (38) | 1 |
| (09) | 3 | (19) | 3 | (29) | 4 | (39) | 2 |
| (10) | 1 | (20) | 1 | (30) | 4 | (40) | 4 |

(ලකුණු 01 x 40 = 40)

### II පත්‍රය

### I කොටස

(01) (අ) i A - කූටකණ්ණඅභය B - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
C - ක්ලෝඩියස් ටොලමි D - මහානාම හිමි (ලකුණු 01 x 4 = 4)

(ii) 1. ගල්පොත සෙල්ලිපිය
2. පොළොන්නරුව / පුලතිසිපුර
3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල / නිශ්ශංකමල්ල
4. ලංකාවේ දිගම සෙල්ලිපිය (ලකුණු 01 x 4 = 4)

(iii) 1. දෙවන රජසිංහ
2. මහනුවර / උඩරට
3. මහා අස්ථාන කුමරු
4. පෘතුගීසි (ලකුණු 01 x 4 = 4)

(02) (i) රෝමය, චීනය, ඉන්දියාව. (ලකුණු 01 x 3 = 3)

(ii) A - පදිර්රුපත්තු B - ප්ලිනි C - දීපවංශය D - ටැම්ලිපි (ලකුණු 01 x 4 = 4)

(iii)
- රාවණාඇල්ල ගල්ලෙන - දෙකට බෙදනසේ සිදුරු විද රළු දාර හා පිටතට නෙරා තිබෙන කොටස් මට්ටම් කල රතුපාට ගුරුගල් ආලේප කල මිනිස් හිස් කබල
- පාහින්ගල ගල්ලෙන - රතු පැහැති ගුරුගල් ආලේපකල මිනිස් ඇටසැකිලි වලට අයත් කොටස්
- කුරුවිට බටදොඹලෙන - ඇටසැකිලි නමා වකුටු කර වළලා තිබීම.

(කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)

(iv) • දඩයම් කළ සතුන් උදා-
• ශාඛමය ආහාර උදා-
• මිරිදිය මාළු වර්ග උදා-
• ගොළුබෙල්ලන් / කලපු බෙල්ලන් (කරුණු 2ට ලකුණු 02යි. විස්තරයට ලකුණු 04යි)

(03) (i) ඉබ්බන්කටුව , ගල්සොහොන්කනත්ත, යටිගල් පොත්ත (ලකුණු 01 x 3 = 3)
(ii) සුමනවාපීගාම, කඩහවාපීගාම, විහාරවාපීගාම, හුන්දරීවාපිගාම (ලකුණු 01 x 4 = 4)
(iii) පිලිස්සූ මැටි වලං භාවිතය, ක්‍රමවත් සුසාන චාරිත විධි, යකඩ ලෝහ භාවිතය, ස්ථිර ජනාවාස, කෘෂිකර්මාන්තය ඇරඹීම. (කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)
(iv) එළාර පැරදවීම, හල්ලුක පැරදවීම, සංවිධානාත්මක සටන් ව්‍යාපාරය, රට එක්සේසත් කිරීම, වෙහෙර විහාර සෑදවීම, රුවන්වැලිසෑය ඉදිකිරීමේ දී වැටුප් ගෙවීම හා දන්සැල් පැවැත්වීම..
(සේවාවන් හා විස්තරයට ලකුණු 06යි)

(04) (i) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය (ලකුණු 01 x 3 = 3)
(ii) A - වෙජ B - තුලාධර C - නවඳලිහේන D - වොහාර (ලකුණු 01 x 4 = 4)
(iii) • වෙළඳපොලට පැමිණෙන කරත්ත වලින් මිස වෙළඳපොල පසුකරගෙන යන කරත්ත වලින් බදු අය නොකල යුතුබව.
• බුලත් වෙළදාම් කිරීමේ දී හිරුඑළියෙන් ආවරණය වන ලෙස මඩුවක් තුල පමණක් වෙළදාම් කිරීම.
• පොහොය දිනවල වෙළදාම් කිරීම තහනම් බව.. ආදී වෙනත්(කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)
(iv) • ලෝහ කර්මාන්තය • කුඹල් කර්මාන්තය • රන් කර්මාන්තය
• පේෂ කර්මාන්තය • ඇත්දත් කැටයම් කර්මාන්තය • මැණික් කර්මාන්තය
(කර්මාන්තවල ඓතිහාසික විස්තරය මූලාශ්‍ර අනුව දක්වා තිබීම සැලකිල්ලට ගෙන ල. 2 × 3 ප්‍රධානය කරන්න.)

(05) (i) දකපති,, බොජකපති, මතරමජිබක (ලකුණු 01 x 3 = 3)
(ii) A - අඩික B - පීඩන ශල්කනය C - ගොඩවාය D - දූඩිගම ඇත් පහන(ලකුණු 01 x 4 = 4)
(iii) වැව් බැම්ම, රළපනාව, සෙරොව්ව, බිසෝකොටුව (කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)
(iv) • රාජ්‍යත්වය දැරීම උදා- ලීලාවතී, කළ්‍යාණවතී, චූලසීවලී දේවි...
• රාජ්‍යත්වයට පත්නොවී ජනතා බුහුමනට ලක්වීම උදා - විහාරමහා දේවිය, සුගලා බිසව, සෝමා දේවිය
• ප්‍රාදේශීය නායකත්වය උදා - පරමකලු සමනා... ආදී වෙනත්. ( ල. 2 × 3 )

(06) (i) අනුරාධපුරය, පොළොන්නරුව, මාගම (ලකුණු 01 x 3 = 3)
(ii) A - ඉබන්බතුතා B - දෙවන පරාක්‍රමබාහු C - චෙන් හෝ
D - විජය කුලංකෙ (ලකුණු 01 x 4 = 4)
(iii) • වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යට යටත් කරගැනීම.
• සපුමල් කුමරු යටතේ සේනාව යවා යාපනය ජය ගැනීම.
• උඩරට ජෝතිය සිටුගේ කැරැල්ල මැඩලීම.
• ද.ඉන්දියාවේ අදිවිරරාම පටුන ආක්‍රමණය කිරීම.
• රට එක්සේසත් කර ආර්ථික දියුණුව ඇති කිරීම. (කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)
(iv) • දුර්වල පාලකයන් බලයට පත් වීම.
• කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය

- ආර්ථික පරිහානිය
- කාලිංග මාඝගේ ආක්‍රමණය (හේතු තුනට ල. 3 විස්තරයට ල.3 )

(07) (i) දීග විවාහ, බින්න විවාහ, එකගෙයි කෑම (ලකුණු 01 x 3 = 3)

(ii)
- වැදගත් නායකයින් සම්බන්ධ නඩු
- කැරලි කෝලාහල නඩු
- කුමන්ත්‍රණ නඩු
- රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු
- විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු (ලකුණු 01 x 4 = 4)

(iii)
- පෘතුගීසසීන්ට උඩරට අල්ලා ගැනීමට නොදී ආක්‍රමණ වැලැක්වීම උදා-
- ආගමික සේවා උදා -
- ආර්ථික සේවා උදා - (කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)

(iv)
- වී ගොවිතැන, හේන් වගාව, ගෙවතු බෝග, අතිරේක ආහාර ඇතුලු කෘෂිකාර්මික කටයුතු
- සත්ව පාලනය
- දියුණු කර්මාන්ත උදා - යකඩ, දැව, පන්, පිත්තල, ලාක්ෂා (විස්තරයට අනුව ල. 2 × 3 )

(08) (i) තේ, කෝපි, රබර්, කොකෝවා, සිංකෝනා.... (ලකුණු 01 x 3 = 3)

(ii) A - ජොහැන්නස් ගුටන්බර්ග් B - ගැලීලියෝ ගැලිලි

C - ෆර්ඩිනන්ඩ් මැගලන් D - අයිසෙක් නිව්ටන් (ලකුණු 01 x 4 = 4)

(iii)
- කොන්ස්තන්තිනොපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම.
- වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහි වීම.
- බුද්ධි ප්‍රබෝධනය
- පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම. (කරුණු 3ට ලකුණු 03යි. විස්තරයට ලකුණු 02යි)

(iv)
- පෘතුවිය ගෝලාකාර බව සොයාගැනීම.
- නාවික ගමන් සඳහා උපකාරීවන මාලිමාව හා උතුරු තරු මාපකය නිපදවීම.
- ටොලමිගේ ලෝක සිතියම්
- ජාතික රාජ්‍ය දේශගවේශණය සඳහා අනුග්‍රහ දැක්වීම ( ලියන ලද කරුණු දෙක හා විස්තරයට ල.3 × 2 )

(09) (i) ජෝන් වයික්ලිප්, ජෝන් හස්, ඉරාස්මස්, මාටින් ලූතර් (ලකුණු 01 x 3 = 3)

(ii) A - බර්තොලමියු ඩයස් B - නිකලස් කොපර්නිකස්

C - ජොහැන්ස් කෙප්ලර් D - විලියම් හාවේ (ලකුණු 01 x 4 = 4)


(iii) A - ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජිලෝ, රෆායල්, මැසෙක්ෂියෝ, බොට්ටි චෙල්ලි (ලකුණු 01 x 3 = 3)

B - මොනාලිසා, අන්තිමභෝජන සංග්‍රහය, අවසාන විනිශ්චය, ආදම්ගේ චිත්‍රය. (ලකුණු 01 x 2 = 2)

(iv) A -
- නව ආණ්ඩුවට ප්‍රතිසංස්කරණ යටතේ ලැබුණු පාර්ලිමෙන්තු ආණ්ඩු ක්‍රමය.
- අලුත් පාලන ක්‍රමයට ගැලපෙන නව නිලධාරි පන්තිය
- රෝම ලන්දේසි නීතිය ස්ථාපිත වීම.

B -
- ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳවැටීම
- වානිජ බෝග හඳුන්වා දීම.
- ආනයන අපනයන ආර්ථිකයක් බිහි වීම
- මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීම
- වෙළඳ නගර බිහිවීම ( විස්තරයට අනුව ල. 2 × 3 )

(01) අ (i)



(01) අ (ii)

